දිවි අහිමි කර ගැනීම් වාර්තා කිරීමේදී ඊට අදාළව පවතින ආචාර ධර්ම අනුගමනය කිරීම වැදගත් වන්නේ, ආචාර ධාර්මික නොවන, වගකීම් සහගත නොවන ලෙසකින් දිවි අහිමි කර ගැනීම් වාර්තා කිරීම ඔස්සේ වක්‍රාකාරයෙන් තවත් දිවි අහිමි කරගැනීම් වෙත පෙළැඹවීම් ඇති කිරීමේ හැකියාවක් පවතින බව පර්යේෂකයින් පවසන නිසාවෙනි.

ඒ අනුව බලන විට, NewsWire ඔස්සේ දිවි අහිමි කරගැනීමේ ප්‍රවෘත්තිය හැකිතාක් දුරට ආචාර ධාර්මිකව ප්‍රකාශයට පත් කොට තිබීම ප්‍රශංසා කටයුතු වේ. මෙහි දිවි අහිමි කරගත් තැනැත්තා අපරාධයක් සිදුකර ඇතැයි හැඟවෙන ලෙස committed suicide යනුවෙන් සඳහන් කර නොමැත. එසේම වඩාත් වැදගත් ලෙසින්, දිවි අහිමි කරගැනීමේ පෙළඹවීමක් ඇති තවත් අයෙකුගේ දිවි බේරාගැනීමට උපකාරී වන ආකාරයට හදිසි උපකාරක අංක ප්‍රමුඛතාවයකින් යුතුව සඳහන් කිරීමටද ඔවුන් උත්සුක වී ඇත. ඒ සම්බන්ධයෙන් පාඨක අපගේ ප්‍රශංසාව ඔවුන්ට පිරිනමමු.

#MediaEthicsSL #lka #News #web #NewsWire